PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2024-09-13

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

ගරු සභාපතිතුමනි,

**නීති විරෝධී පක්ෂ කාර්යාල සම්බන්ධවයි.**

නීති විරෝධී මැතිවරණ කාර්යාල සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය විසින් ප්‍රදේශ 84ක් ආවරණය වන පරිදි සංගණනයක් පවත්වන ලදී. එහිදී මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරණයට අදාලව ඡන්ද විමසීම් ප්‍රචාරක කාර්යාල පිහිටුවීමට සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයේ (චක්‍රලේඛ EC/EDR/PRE/2024/21) සඳහන් කරුණු වලට පටහැනි ආකාරයට පවත්වාගෙන යන කාර්යාල 307 ක් පිළිබඳව තොරතුරු වාර්තාවී ඇත.

එහිදී ප්‍රධාන වශයෙන් සලකා බැලූ කරුණු වන්නේ,

01. කිසිදු ගොඩනැගිල්ලක් නොමැති ස්ථාන වල කාර්යාල ලෙස සඳහන් කරමින් සකස් කර තිබීම.
02. කාර්යාලය අවම වශයෙන් පැය හතරක් විවෘතව නොතැබීම
03. කාර්යාලයේ ප්‍රචාරක පුවරු නියමිත ප්‍රමාණයට වඩා සවිකර තිබීම.
04. විශාල වශයෙන් සැරසිලි කර කොඩි බැනර් ආදිය කාර්යාල සීමාවෙන් පිටත සවිකර තිබීම.
05. අපේක්ෂකයන් නොවන පුද්ගලයන්ගෙ රුව සහිතව කටවුට් ප්‍රදර්ශනය කරමින් කාර්‍යාල පවත්වාගෙන යාම.
06. කාර්යාල දෙකක් අතර නියමිත දුර පවත්වා නොගැනීම.
07. කාර්යාලවලට දක්වා තිබෙන අවම ප්‍රමාණය නොමති වීම.

මෙලෙස නිරීක්ෂණයට ලක්වූ කාර්යාල අතර සජිත් ප්‍රේමදාස, අනුර දිසානායක, රනිල් වික්‍රමසිංහ යන අපේක්ෂකයන්ගේ කාර්යාල විශාල වශයෙන් පවතින අතර ඊට අමතරව වාර්තා වී ඇත්තේ නාමල් රාජපක්ෂ ,දිලිත් ජයවීර සහ නුවන් බෝපගේ යන අපේක්ෂකයන්ගේ කාර්යාල සම්බන්ධයෙන් පමණි.

අපේක්ෂකයන් විශාල ප්‍රමාණයක් නාම යෝජනා භාර දී තිබුනත් ඡන්ද ප්‍රචාරක ක්‍රියාවලියේ නිරත වන බවට පෙනී යන්නේ අපේක්ෂකයන් සුලු ප්‍රමාණයක් පමණි.

එම නිරීක්ෂණයේදී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට පටහැනිව පවත්වාගෙන යන කාර්යාල පිළිබඳව විස්තර ඇතුළත් ලේඛන පහතින් අමුණා ඇති අතර ඒ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත් - අසංග කරවිට, මැතිවරණ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
මාධ්‍ය ආයතන හා උනන්දුවක් දක්වන සෙසු පාර්ශව

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com